"කඩවත සමාජ ශාලාවකින් කතුන් 33 ක් අත්අඩංගුවට, වටලද්දී සිටියේ සූර්පිට නටමින්" යන සිරස්තලය යටතේ මව්බිම පුවත්පතේ ජනවාරි 12, 2022 පුවත් වාර්තාවක් පළවී තිබිණි.

ලද තොරතුරකට අනුව අධිකරණයෙන් ලබාගත් සෝදිසි වරෙන්තුවක් මත මෙම වැටලීම කළ බවත්, සෞඛ්‍ය නිරෝධායන නීති කඩ කරමින් සමාජ ශාලාවේ සිටි මෙම කාන්තාවන් තිස්තුන් දෙනා අත්අඩංගුවට ගත් බවත් පුවත් අන්තර්ගතයේ වැඩිදුරටත් සඳහන්ව තිබිණි. මීට අමතරව, "[මෙම කාන්තාවන්ගෙන්] බහුතරයක් විවාහයෙන් වෙන්ව සිටින" බවද පුවත් අන්තර්ගතයේ සඳහන්ව තිබිණි.

ඔබ සිතනා ආකාරයට,

1) මෙම පුද්ගලයින් 33 අත්අඩංගුවට ගැනීමට හේතුව වන්නේ සෞඛ්‍ය නිරෝධායන නීති කඩ කිරීම යැයි, පුවතේ සඳහන් කරුණු ඔස්සේ අනුමාන කළ හැක. එසේ නම්, ඔවුන් "බහුතරයක් විවාහයෙන් වෙන්ව සිටින" බවත්, "වටලද්දී සූර්පිට නටමින්" සිටි බවත් මෙම පුවතට අදාළ වන්නේ කෙසේද?

2) ඔබ සිතන ආකාරයට, ඉහත කරුණු පුවතට අදාළ නොවන්නේ නම්, මෙම පිරිස මත්පැන් පානය කිරීම, සමාජ ශාලාවක නර්තනයෙහි යෙදීම සහ ඔවුන් විවාහයෙන් වෙන්ව සිටින බව පුවතෙහි සඳහන් කර ඇත්තේ, එම කරුණු "කාන්තාවන්" විෂයෙහි වැරදි යයි පෙන්වීමටද?

3) එයද එසේ නම්, ඔබ සිතනා ලෙසට, මෙම පුවත් වාර්තාව ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගනිමින් කාන්තාවන්ව කොන් කිරීමක් සහ ඒ නයින් මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් සිදු කරන්නේ නොවේද?

මේ පිළිබඳ ඔබේ අදහස කුමක්ද?